# ලයනල් ගුරුගේ එ. අනුරාධපුර මහා රෝහල

RTIC Appeal 1206/2019 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය සහ රීති අංක 30 ප්‍රකාරව යොමු කරන ලද ඉවත් කර ගැනීමේ අයදුම්පත්‍රය - 2019.08.06 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලදී

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක - ලයනල් ගුරුගේ**
**නොතිසි ලත් පාර්ශවය - නම්කළ නිලධාරී, අනුරාධපුර මහා රෝහල**

**පෙනීසිටීම**
අභියාචක - **පැමිණ නොසිටින ලදි**
පොදු අධිකාරිය - පැමිණ නොසිටින ලදි

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | **2018.03.30** |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | **ප්‍රතිචාරයක් නොමැත** |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | **2018.07.09** |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | **ප්‍රතිචාරයක් නොමැත** |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | **2019.02.05** |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.03.30 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

I. 2010 සිට 2017 දක්වා කාලය ඇතුළත අනුරාධපුර මහා රෝහලට ඇතුළත් වූ වකුගඩු රෝගීන් සහ පිළිකා රෝගීන්ගේ සංඛ්‍යාව කොපමණද?
II. එම රෝගීන්ගෙන් කොපමණ ප්‍රමාණයක් මිය ගියේද?
III. දැනට ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සංඛ්‍යාව කොපමණද?

පනතේ සඳහන් නියමිත කාල පරාසය තුළ කටයුතු කිරීමට තොරතුරු නිලධාරියා හා නම්කළ නිලධාරියා අපොහොසත්වීම මත 2019.02.05 දිනැතිව අභියාචක විසින් කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශ්වයම පැමිණ නැතිබව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

අභියාචක විසින් 2019.0**5**.0**3** හා **2019.07.05** දිනැතිව කොමිෂන් සභාවට ලිඛිතව දන්වා ඇත්තේ අනුරාධපුර මහා රෝහල අදාළ තොරතුරු මේ වනවිට ලබා දී ඇති බැවින් මේ පිළිබඳව විභාගයක් පැවැත්වීමට අවශ්‍ය නොවන බවයි.

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 30(1) පහත පරිදි වේ.

*අභියාචනයක් විභාග වෙමින් පවතින විට අභියාචකට ඕනෑම අවස්ථාවකදී කොමිෂන් සභාව වෙත ලිඛිතව හේතු දක්වා, ඔහු/ඇය විසින්ම අත්සන් කර, අනෙක් පාර්ශවය/න් වෙත ලබාදීම සඳහා පිටපතක් ද සමග ඉදිරිපත් කිරීම මගින් සිය අභියාචනය ඉවත් කර ගැනීමට හැකි අතර, කොමිෂන් සභාව අනතුරුව සියලු පාර්ශවයන්ට මෙකී අභියාචනය ඉවත් කර ගැනීම පිළිබඳ දැනුම්දීම ලබාදෙනු ඇත.*

රීති අංක 30(3) පහත පරිදි වේ.

*ඉහත උප රීති (1) සහ (2) හි සඳහන් කරන හේතු සම්බන්ධයෙන් කොමිෂන් සභාව තෘප්ත වේ නම්, අභියාචනය ඉවත් කර ගැනීමට ඉඩ දෙනු ඇත.*

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 30(3) ප්‍රකාරව, ලබාදී ඇති හේතුන් වලින් කොමිෂන් සභාව සෑහීමකට පත්වී ඇති බැවින් අභියාචනය ඉවත් කර ගැනීමට අවසර දෙනු ලැබේ.

*********